# බළන්ගොඩ නගර සභාව

## 2020-05-27 දිනැති විශේෂ සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2020.05.27**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

අද දින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය හා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය පිළිගනිමින් ගරු සභාපතිතුමා විසින් මෙදින විශේෂ මහ සභාව පැවැත්වීමේ අරමුණ පැහැදිලි කරන ලදී. එහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ 2020 මැයි මස 19 වන දින බලන්ගොඩ නගරයට හදිසියේ ඇතිවූ හදිසි ගංවතුර තත්ත්වය හේතුවෙන් විශේෂ මහ සභාවක් කැඳවන ලෙසට ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබුණු ඉල්ලීම අනුව අද දින මෙම සභාව පවත්වන බව ද විශේෂ මහ සභාවක් කැඳවීමේ දී සාකච්ඡා කිරීමක් ප්‍රමාණවත් නොවන බැවින් අදාළ කාරණාව සම්බන්ධයෙන් තීන්දුවක් ගත යුතු බව ද පවසන ලදී.

බලන්ගොඩ නගරයට ගංවතුර ගැලීම අප සියළු දෙනා මුහුණ දුන් අත්දැකීමක් වන අතර, ආණ්ඩුකාරතුමාගේ නියෝගයක් පරිදි සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමිය, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා, සබරගමුව පළාත් සභාවේ සමාජ සේවා පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමා හා සහකාර අධ්‍යක්ෂකතුමිය සහ බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු අදාල නිළධාරීන් සියලු දෙනා සම්බන්ධ වී ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ බව ගරු සභාපතිතුමා පවසන ලදී. එහිදී බලන්ගොඩ නගරයට ගංවතුර ආපදා තත්ත්වයක් ඇති වීම සඳහා හේතු පාදක වූ ප්‍රධාන කරුණු ගණනාවක් හඳුනා ගත් අතර ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමේ දී ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා ආපදාවන්ට ලක්වූවන් සඳහා අවශ්‍ය සහන සැලසීම පිළිබඳවත්, ඉදිරියේදී ගංවතුර ආපදා තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳවත් සාකච්ඡා කළ බව ගරු සභාපතිතුමා සඳහන් කරන ලදී. එමෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ඉංජිනේරු සංස්ථාව සමඟ සාකච්ඡා කර, දොරවෙල ඔයේ ජලය ගලා යාමට බාධා වන පරිදි හරස් වී ඇති ස්ථාන හා ගොඩවී ඇති ස්ථාන ඉවත් කිරීම සඳහා මූලිකව ඉටු කළ හැකි කාර්යයන් පිළිබඳ ඇස්තමේන්තුවක් සකස් කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස ද ඒ සඳහා අවශ්‍ය සහයෝගය තමා ලබා දෙන බවට ද ප්‍රධාන ලේකම්තුමිය පැවසූ බව ගරු සභාපතිතුමා වැඩිදුරටත් සඳහන් කළේය. එබැවින් ඒ පිළිබඳව අදහස් තිබේනම් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන ලෙස ද එවිට අදාළ වාර්තාව සකස් කිරීමේ දී ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා හා අදහස් එයට එක් කල හැකි බව ද පවසන ලදී.

අනතුරුව බලන්ගොඩ නගරයේ ගංවතුර අවම කිරීම වෙනුවෙන් සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාව කාර්මික නිළධාරී පී.ඩබ්.එස්.සේනාධීර මහතා විසින් ගරු සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලද අතර, එම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, දොරවෙල ඔය ගංවතුර තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා කටයුතු සිදු කිරීමේ දී ජාති, ආගම්, කුල භේද නොසලකා පුළුල් කළ

යුතු ස්ථාන පුළුල් කර, කපා ඉවත් කළ යුතු තැන් කපා ඉවත් කළ යුතු බවත් කොතරම් සාකච්ඡා කළ ද වැඩසටහන් කළ ද ව්‍යාපෘති සකස් කළ ද එම කාර්යය කඩිනමින් ඉටු නොකරන්නේ නම් ඒවායින් ප්‍රයෝජනයක් නොමැති බව ද එසේ වුවහොත් සුන්දර බළන්ගොඩ විනාශ වී යා හැකි බව ද පවසන ලදී. එමෙන්ම තමන් ගරු ප්‍රධාන ලේකම්තුමිය සහභාගී වූ ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා සහභාගී වූ අතර එහි දී ගඟේ දෙපස ඇති ඉවුරු ගඟ පැත්තට තල්ලු වී ඇති බැවින් ගඟ පටු වී ඇති බව ද ගඟට හානිවන පරිදි අලුත් බැම් සාදා ඇති බව ද සමහර ස්ථානවල ගල් ගොඩවල් ආදිය ඇති බව ද හඳුනා ගත් බව පැවසීය. එවැනි ස්ථාන ඉවත් කිරීම සඳහා නගර සභාව වෙත බලය පවතින බැවින් එම ස්ථාන ඉවත් කරන ලෙස ද ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය ගරු සභාපතිතුමා වෙත ලබා දෙන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා මෙම ගංවතුර ඇති වීම කෙරෙහි මිනිසා විසින් සිදු කරන ලද නව ක්‍රියාකාරකම් ද බලපා ඇති බව ද අපිට කුමන ස්ථානයක හෝ වැරැද්දක් සිදු වී ඇති බව තමන් නගරයේ මන්ත්‍රීවරයා වශයෙන් පිළිගන්නා බව ද සඳහන් කළේය. එමෙන්ම නගරයට මෙවැනි දෙයක් සිදු වීම සම්බන්ධව අප වගකිව යුතු අතර, තමන් සිය ඇස් දෙකෙන්ම මෙම සිදු වීම දුටු බවත්, නගරයේ හදවත බඳු ව්‍යාපාරිකයින් මේ මොහොත වන විට අසරණ තත්ත්වයට පත්ව ඇති බැවින් ඔවුන්ට මෙම අවස්ථාවේදී ලබා දිය හැකි උපරිම සහනය ලබා දෙන ලෙසත් පැවසීය. මීට අමතරව කඩ හිමියන් පිළිබඳ අවධානය යොමු කළ යුතු බවද අතුරු බදු දී ඇති කඩ කාමර වෙනුවෙන් ගංවතුර සඳහා ලැබෙන සහනාධාරය හිමිවනුයේ කඩ කාමරයේ හිමිකරුට බැවින් එහිදී නගර සභාවෙන් නිකුත් කරන ලද වෙළෙඳ බලපත්‍රය හා වෙළෙඳ සංගමයෙන් වෙළෙඳ ව්‍යාපාරිකයෙකු බවට තහවුරු කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීමෙන් කඩ කාමරය පවත්වාගෙන යන පුද්ගලයාට එම වන්දි මුදල ලබා දිය හැකි බව ප්‍රාදේශීය ලෙකම් කාර්යාලයේ පැවති රැස්වීමේ දී සාකච්ඡා වූ බව ද පවසන ලදී. එමෙන්ම බොහෝ ව්‍යාපාරික ස්ථාන ලියාපදිංචි නොකර ඇති බැවින් මෙම අවස්ථාවේදී ගැටළුවක් පැන නගින බව ද සමහර වෙළෙන්ඳන් අසත්‍ය තොරතුරු ආපදා නිළධාරින් වෙත ලබා දී ඇති බව ද පැවසූ ගරු මන්ත්‍රීතුමා ගංවතුරෙන් ලක්ෂ 500 ක පමණ අලාභයක් සිදු වී ඇති බව ද මහා පරිමාණ ව්‍යාපාරිකයින් කිහිපදෙනෙකු පමණක් ගංවතුරට ලක්වූ අතර ඔවුන් වෙනත් රක්ෂණාවරණයක් ලබා ඇති බැවින් ඔවුන්ට ගැටළුවක් නොමැති බව ද සඳහන් කළේය. ගංවතුරෙන් විපතට පත්වූ සෑම ව්‍යාපාරික ස්ථානයක් සඳහාම තමන් පෞද්ගලිකව ගොස් සොයා බැලූ බවද, එහි දී ඇතැම් ව්‍යාපාර ස්ථාන සම්පූර්ණයෙන්ම හානියට පත්වී ඇති බව නිරීක්ෂණය වූ බැවින් එම පිරිස පිළිබඳ පළමුව සොයා බැලිය යුතු බව ද ඔවුන් සඳහා රු. 5,000.00 ක හෝ ණය මුදලක් ලබා දිය හැකිනම් එය ලබා දෙන ලෙස ද වැඩිදුරටත් පැවසූ ගරු මන්ත්‍රීතුමා, සියළුම ව්‍යාපාරිකයන් තමා විසින් ගෙවිය යුතු ගෙවීම් ගෙවා අවසන් වන්නේ අප්‍රේල් හා මැයි මස වන නමුත් ගිය වසරේ පාස්කු දින ප්‍රහාරය නිසාත්, මෙවර කොරෝනා ව්‍යාප්තිය නිසාත් ව්‍යාපාරිකයන් අසරණ වූ අතර ගංවතුර තත්ත්වය හේතුවෙන් තවත් අසරණ වී ඇති බවත් පවසන ලදී. එමෙන්ම වෙළෙඳ සංගමයේ සභාපති ලෙස ව්‍යාපාරිකයින් පිළිබඳ කථා කිරීම තම යුතුකමක් හා වගකීමක් බවත් මෙම අවස්ථාවේදී කිසිඳු භේදයකින් තොරව කටයුතු කළ යුතු අතර එසේ නොමැති වුවහොත් ගරු සභාවේ මන්ත්‍රීවරුන් සඳහා ජනතාව ශාප කරනු ඇති බවත් තමන් බළන්ගොඩ නගරයට ආදරය බවත්, පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙසේ ආධාර ලබා දීමට නම් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු අතර කොරෝනා වසංගත තත්තත්වය සමඟ සභාවේ ආදායම ද අහිමි වී ඇති මොහොතක මේ සඳහා අවසරයක් නොලැබී යනු ඇති බවට සහකාර කොමසාරිස්තුමා පැවසූ බවයි.

එනමුත් ලබා දිය හැකි සහන ලබා දීම සඳහා කටයුතු කළ හැකි බැවින් ඒ සඳහා අනුමැතියට ඉදිරිපත් කරන ලෙස එතුමා පැවසූ බව ගරු සභාපතිතුමා වැඩිදුරටත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා තමන් පොලේ උපන් මිනිසෙක් ලෙස බිම් මට්ටමේ සිටින පොඩි වෙළෙන්ඳන් ගැන කථා කරන බවත් බළන්ගොඩ පොළ එක් එක් කාලයන්වල දී ස්ථාන අටක පැවතුන අතර, බොහෝ දුෂ්කරතා මැද වර්තමාන පොළ පවතින ස්ථානයේ ඉදි කිරීමට කටයුතු කළ බවත් ඒ සඳහා කෝටි 4.5 ක මුදලක් වැය වූ අතර එහිදී හිටපු ආණ්ඩුකාරතුමා වන මොහාන් එල්ලාවල මැතිතුමා උදව් කළ බවත් පැවසීය.

එමෙන්ම මහජන පොළේ වෙළෙන්ඳන් නිසි පරිදි ලියාපදිංචි වී නොමැති බැවින් මෙම අවස්ථාවේදී එය ගැටලුවකට පත් වී ඇති බවද එනිසා ඔවුන්ට අයිතිය තහවුරු කිරීමට නොහැකි වී ඇති බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා, සාමාන්‍ය වෙළෙන්ඳන්ට අසාධාරණයක් වී ඇති බැවින් නගර සභාවක් ලෙස එම අවස්ථාවේ දී වෙළෙඳාම් කළේ කවුද කොපමණ වටිනාකමක තොග තිබුණේ ද යන්න ගණනය කර මෙම වන්දිය ඔවුන්ට ලබා දීමට කටයුතු කරන ලෙස ආපදා කාර්යාලයට දැන්විය යුතු බව ද සමහර වෙළෙන්ඳන් අසත්‍ය තොරතුරු සපයමින් සිටින බව ද පවසන ලදී.

තවදුරටත් අදහස් දක්වමින් ගරු මන්ත්‍රීතුමා පවසා සිටියේ පිට ප්‍රදේශවලින් පැමිණි වෙළෙන්ඳන් හා නගරයේ වෙළෙන්ඳන් සිටින නමුත් ඇතැම් වෙළෙන්ඳන් පසුවදා විකිණීම සඳහා ගෙන ආ එළවළු හා බඩු තොග ගසා ගිය බවට අසත්‍ය බිල්පත් ඉදිරිපත් කරන බවයි. එමෙන්ම කොරෝනා අවසන් වී පොළ ආරම්භ කළ විගස පොළ සංගණනයක් සිදු කරන ලෙස ද නගර සභාව විසින් ආපදාවට ලක් වූ වෙළෙන්ඳන් වෙළෙඳාම් කළ බවට තහවුරු කර සහතිකයක් ලබා දීමට කටයුතු කරන ලෙස ද පැවසීය.

මීට අමතරව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් හොඳ තත්ත්වයේ පවතින බඩු භාණ්ඩ ද ට්‍රැක්ටර්වලට පැටවීමට කටයුතු කර ඇති බවද එම අසාධාරණයට ලක් වූ කිහිපදෙනෙකු සිටින බැවින් ඔවුන් පිළිබඳව අවධානය යොමු කරන ලෙස ද පවසන ලදී.

අතීතයේ ගංවතුර තත්ත්වයක් පැවතුන ද දොරවෙල ඔය ව්‍යාපෘතිය සිදු කළ පසු ගංවතුර ගැලූ පළමු අවස්ථාව මෙය වන අතර පස් ගොඩ කළ ස්ථාන හා බැමි ඉදිකර ඇති ස්ථාන මෙන්ම ගල් ගොඩවල් ඇති ස්ථාන ඉවත් කර ක්ෂණිකව විසඳුමක් මේ සඳහා ගත යුතු බව පැවසූ ගරු මන්ත්‍රීතුමා, එසේ නොමැති වුවහොත් නැවත වරක් අධික වර්ෂාවක දී ගංවතුර තත්ත්වයක් ඇති විය හැකි බව ද එසේ නොමැති වුවද ගංවතුර ඇතිවේයැයි ජනතාව බියට පත් වී තම කඩ කාමර, වෙළඳ භාණ්ඩ එහේ මෙහේ ගෙන යා හැකි බව ද මහජන පොළේ වෙළෙන්ඳන් වෙළෙඳාම් කළ බවට තහවුරු කරන ලිපිය අදාළ නිළධාරීන්ට ලබා දී ඔවුන්ට වන්දිය ලබා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කර දෙන ලෙස ද පවසන ලදී.

මෙහෙදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ පැරණි වෙළෙන්ඳන් වෙළෙඳාම් කළ බවට තහවුරු කිරීම සඳහා නගර සභාව සතු තොරතුරු තිබෙන නමුත් කොරෝනා ව්‍යාප්තිය සමඟ මහජන

පොළේ අළුත් වෙළෙන්ඳන් බොහෝ පිරිසක් සිටින නිසා නව වෙළෙන්ඳන් පිළිබඳ තහවුරු ලබා දීමේ දී ගැටළුවක් පැණ නගින බව යි.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

තම ජීවිත කාලය තුල කෙදිනකවත් දක නැති ගංවතුර තත්ත්වයක් බලාපොරොත්තු නොවූ අවස්ථාවක පැමිණීමෙන් මිනිසුන්ට අලාභ හානි සිදු වූ අතර, බස්නැවතුම්පළ සමහර කඩ කාමරවලට ද අලාභ හානි සිදු වීමෙන් කඩ කාමර වසා දැමීමට සිදු වී ඇති බව ද ෆලීල් හාජ්ජියාර් මාවතේ නිවාස 08කට ගංවතුරෙන් සම්පූර්ණ හානි සිදු වූ බවද, මේ නිසා ඔවුන්ට ලබා දිය හැකි වන්දි මුදල ලබා දිය යුතු බවද සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා ඒ පිළිබඳව ද අවධානය යොමු කරන ලෙස පවසන ලදී. එමෙන්ම ඉදිරියේදී ගංවතුර වැළැක්වීම සඳහා සැලැස්මක් සකස් කළ හැකිනම් මෙම සභාවේදී ගත හැකි එකම තීන්දුව එය බවද දොරවෙල ඔය ඒ අනුව සකස් කරන ලෙසද ගඟ ගලා යන සමහර ස්ථාන ඇළක්වන සේ පටුවී ඇති බවද වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා දොරවෙල ඔය පහළ කොටස බළන්ගොඩ ප්‍රාදේශීය සභාව හරහා සකස් කරවන ලෙස ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කරන ලෙස ද ආධාර ලබා දිය නොහැකි නමුත් ලබා දිය හැකි සහන ලබා දෙන බව ද පවසන ලදී. එමෙන්ම රාත්‍රී කාලයේදී මෙම ගංවතුර සිදු වූවානම් ජීවිත හානි සිදුවිය හැකිව තිබූ බවද එම නිසා රාත්‍රී කාලයේදී මහජන පොළේ සිටින පිරිසට නගර සභා ඉඩමක හෝ නිවාස ඉදිකර දෙන ලෙස ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

අද දින න්‍යාය පත්‍රයේ සඳහන් වන තුන්වන කාරණාව වන ගංවතුර වැනි ආපදා තත්වයන් නැවත වරක් ඇති නොවීම සම්බන්ධව කොට්ඨාශය වෙනුවෙන් තමන් කථා කරන බව ද හුණු කුඹුර කොට්ඨාශයේ සම්පූර්ණ හානි වූ එක් නිවසකුත් අර්ධ හානි වන නිවාස 4කුත් තිබෙන අතර එම ආපදාව සිදුවූ අවස්ථාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සහන සැලස්වීම සඳහා කටයුතු කළ බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමිය ගංවතුර ගැලීමට පෙර ගඟ මැදට විශාල ගස් දෙකක් කඩා වැටී ගඟ හරස්වී තිබූ නිසා එම ස්ථානයෙන් ගඟ පිටාර ගැලූ බවත්, නගර සභාව හරහා එම ගස් දෙක කපා ඉවත් කර දෙන ලෙස ගම්වැසියන්ගෙන් ඉල්ලීමක් තිබෙන බවත් පැවසීය. එමෙන්ම සභාවෙන් ආධාරයක් දීමට හැකියාවක් ඇත්නම් වැසිකිළි ආධාර යටතේ ලබා දෙන ආධාර තුලින් හෝ ඔවුන්ට ආධාරයක් ලබා දෙන ලෙස තමන් යෝජනා කරන බවද එමෙන්ම ගඟේ වතුර බැස යාමට බාධාවක්ව හරස් වී ඇති ස්ථාන පිළිබඳව අවධානය යොමුකරන ලෙස ද පවසන ලදී.

**ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා**

අද විශේෂ මහ සභාව පවත්වන ලෙස කළ ඉල්ලීම අනුව මෙම සභාව පැවැත්වීමට කටයුතු කිරීම පිළිබඳ ගරු සභාපතිතුමාට ස්තුතිය පළ කළ ගරු උප සභාපතිතුමා පැවසූයේ මෙම අවස්ථාවේදී සභාව මඟින් විශාල මුදලක් ආධාර වශයෙන් ලබා දිය නොහැකි බවයි. එමෙන්ම මන්ත්‍රීවරුන්ගේ පුද්ගලික ප්‍රතිපාදන

වලින් වැසිකිළි ආධාර ලබා දුන් අතර හඳුනා ගත් ස්ථානවල වැසිකිළි වලවල් පිරී ඇති බැවින් ඒවා ඉවත් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් හා එම අවස්ථාවේදී ජල බවුසර ආදිය ලබා දුන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාට විශේෂ ස්තුතියක් පුද කරන බව ද නගර සභා සීමාව තුළ නිවාස වලට සිදු වූ හානි තක්සේරු කර ව්‍යාපාරිකයන් සමග හෝ එක් වී දේශපාලන හා ජාති ආගම් භේදයකින් තොරව දිය හැකි ආධාරය ලබා දිය හැකි බවද වෙළෙඳාම් කළ වෙළෙන්ඳන් සඳහා ආධාර ගැනීමට තහවුරු කිරීමේ ලිපිය ලබා දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම ආණ්ඩුකාරතුමා හෝ පැමිණෙන විට ඒ පිළිබඳ ගරු මන්ත්‍රීවරුන්ව දුරකථනයෙන් හෝ දැනුවත් කරන ලෙසද එවිට මන්ත්‍රීවරුන් හට ඒ සඳහා සම්බන්ධ වී තම අදහස් ඉදිරිපත් කළ හැකි බව ද පැවසූ අතර තුන්වන කාරණය පිළිබඳ විශේෂ අවධානය යොමු කර, ඉදිරියට ගංවතුර නොපැමිණිය ද ජනතාව බියට පත්විය හැකි බැවින් සභාවේ මුදල් නොමැතිනම් පළාත් සභාව, ආණ්ඩුකාරතුමා හා ඒ පිළිබඳව සිටින රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගන්නා ලෙස ද දොරවෙල ගඟේ සකස් කළ යුතු ප්‍රධාන ස්ථාන දෙකක් පවතින බව ද පැවසීය. ඉන් එක් ස්ථානයක් වනුයේ හුණුකුඹුර පාලම අසල සිට දොරවෙල පාලම අසල කොටස වන අතර, අනෙක් ස්ථානය ප්‍රධාන බස්නැවතුම්පල පාලම අසළ සිට ඊට පහළ කොටස බවත්, එම ස්ථාන හඳුනා ගෙන කටයුතු කළ යුතු බවත්, නැවත ගංවතුර ඇති නොවේ යැයි සිතා කටයුතු නොකර සිටිය යුතු බවත්, පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රීතුමා පැවසූයේ මෙය කාටත් නුහුරු අත්දැකීමක් වන අතර ස්වභාව දහම ගන්නා තීන්දු වලට ශාප නොකර, ස්වාභාව දහම විසින් ගන්නා තීන්දු තීරණ වලට අනුව අපි හැඩ ගැසිය යුතු බව  හා ස්වාභාව ධර්මය හැමදේම පාලනය කරන බවයි. එදින වර්ෂාව පිළිබඳ කාලගුණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු අනුව බළන්ගොඩ නගරයට මි.මී 99.2ක් ද බෙලිහුල්ඔයට මි.මි 145ක් ද දෙතනගලට මි.මී 89 ක්ද පෙට්ටිගලට මි.මී.205 ක් ද සමනල වැව මි.මී. 45 ක්ද රාස්සගල වත්තට මි.මී. 190 ක ද  වර්ෂාවක් පතනය වී ඇති බව  පැවසූ ගරු මන්ත්‍රීතුමා, මේ නිසා කිසි කෙනෙකුට ඇඟිල්ල දික්කිරීම ප්‍රයෝජනවත් නොමැති බව ද ඇඟිල්ල දික් කරන්නේනම් දිගු කළ යුත්තේ ස්වාභාව දහමට බවද, බෝම්බුව හා මැද්දෙකන්ද ප්‍රදේශයේ සිට විශාල ජලකඳක් පැමිණි අතර දොරවෙල ගඟ කුමන ආකාරයට පුළුල් කළද මෙම ජල ධාරිතාව අනුව ගංවතුර තත්තවයක් ඇති වන බව ද පවසන ලදී.

එමෙන්ම අපිට කුමන දේ අහිමි වුවද ජීවිත හානි සිදුනොවීම පිළිබඳ සතුටු විය යුතු බවද ජනතාව ආධාර බලාපොරොත්තුවන්නේ නම් හැකි ලෙස ආධාර ලබා දීම සුදුසු බව ද යෝජනා කළ අතර කොහෙන් හෝ ආධාර ලැබේනම් එසේ ලබා දීම අවශ්‍ය නොවන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා, දිස්ත්‍රික් ලේකම්තුමා පැමිණි අවස්ථාවේ බැම්මක් අළුතෙන් සකස් කරන බවට සාකච්ඡා කළ අතර, එම ස්ථානයට බැම්මක් අවශ්‍ය වන නමුත් එමගින් එය ඉදිකරන ස්ථානයේ වෙනසක් වීමට පුළුවන් බව ද ගරු සභාපතිතුමාගේ බලය යොදාගෙන එය සැකසීමට අවශ්‍ය නියෝග උපදෙස් හා අධීක්ෂණය සිදු කරන ලෙස ද එසේ නොමැති වුවහොත් එහි පාර කැඩෙන බව ද පවසන ලදී.

මීට අමතරව ඕලුගංතොට මූලික රෝහලේ සුනඛයින් විසින් රෝගීන් සපා කෑමේ සිද්ධියක් වාර්තා වී ඇති බැවින් මේ පිළිබඳව සොයා බලන ලෙස අද දින සභාවේ දී පවසන මෙන් අකිල එල්ලාවල මැතිතුමා තමා අමතා පැවසූ බවද පවසන ලදී.

එමෙන්ම තවදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා කොලනියෙ ගෙවල් 8ක් යට වූ බව ද හුණුකුඹුර එක් නිවසක ගෙය මැදින් ජලය ගිය අතර කිසිදා එසේ නොවූ බව ද අනපේක්ෂිත වර්ෂාපතනය ඒ සඳහා හේතුව බවද දොරවෙල ගඟේ යම් සකස් කිරීමක් සිදු කරන්නේ නම් හෝ වෙනත් බැම්මක් හදන්නේනම් තවත් ස්ථානයකට හානියක් නොවන පරිදි සකස් කරන ලෙස ද මාකට් එක පිටුපස කාණුව ඉවත් කරන ලෙස ද අවශ්‍යතාවය පරිදි අනිවාර්යයෙන්ම ආධාර ලබා දෙන ලෙස ද හැමෝටම එකම මුදලක් ලබා දීම අවශ්‍ය නොවන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් තමන් මෙම ගංවතුර සියසින් දුටු අතර එයට හේතුව ලෙස තමන් දකින්නේ පිට්ටනිය අසළ ගග පළල අඩු වීම හා ගඟේ සමහර ස්ථාන ගොඩ වී තිබීමත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් පස් ගොඩ කිරීම නිසා ගඟ පටුවීම බවද ශුද්ධ කරපු ස්ථානයයෙන් වතුර පිටාර ගැලූ බවද පවසන ලදී. එමෙන්ම මෙම ගංවතුර හේතුවෙන් විශාල දේපළ හානියක් සිදු වූ බවද සහන ලබා දිය හැකි ව්‍යාපාරිකයන් සඳහා සහන ලබා දෙන ලෙසද කඩ කුලී අය කිරීමේදී සහන සලසන ලෙසද පවසන ලදී. එමෙන්ම ගඟ සකස් කිරීමේදී පිට්ටනිය අසළ බැම්ම උස් කරන ලෙසද පවසන ලදී.

වැඩිදුටරත් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා දොරවෙල පාලම අසළ කඩා වැටුණු පාලම හා මුගුණමලේ ගමට යන පාලම සකස් කරන ලෙසද එහි බොහෝ ව්‍යාපාරිකයින් සිටින ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, ලාල් කුෂන් අසළින් පළමු ජලකඳ පිටාර ගලා තිබූ අතර කාණුව අවහිර වූ පසු අඩි 7ක් පමණ උසට ගැලූ බව ද භූමියේ ඇති උස් පහත්වීම අනුව එක් එක් ස්ථානයට වතුර ප්‍රමාණයේ උස වෙනස් වූ අතර ක්‍රීඩාංගණයේ ජල ප්‍රමාණය අඩි 9 ක් උසට තිබූ බවද අනික් ස්ථාන වල අඩි 5 ක් දක්වා වූ බව ද සඳහන් කළේය. පොළ භූමියෙන් දෙවන ජලකඳ පිටාර ගැලූ අතර සමහරු ළමා උද්‍යානය අසළ තිබූ තණකොළ කැපූ නිසා එම ස්ථානයෙන් ගංවතුර ගැලූ බවට චෝදනාවක් කළ නමුත් එය එසේ නොමැති බව ද මිනිසෙක් වූ විට තාර්කික බුද්ධියක් තිබිය යුතු බව ද ඉදිරියට අවශ්‍ය කරන සැලැස්ම සකස් ඇති අතර ඉදිරියේදී ඒ සඳහා ඇස්තමේන්තු සකස් කරන විට කාර්මික නිළධාරිතුමා සමඟ සම්බන්ධ වී අවශ්‍ය කරුණු පෙන්වා දෙන ලෙස ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොඩ කර ඇති ඉඩම් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මන්ත්‍රී කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය අතර සාකච්ඡාවක් ගරු ආණ්ඩුකාරතුමා ගෙන් ඉල්ලා සිටීමට කටයුතු කරන බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

මෙදින විශාල වර්ෂාපතනයක් බළන්ගොඩ නගරයට පතිත වූ අතර 1940 ගැලූ පසු පැමිණි පළමු ගංවතුර මෙය බව ද ක්‍රම කිහිපයකින් ගංවතුර නගරයට පැමිණි බවද ඒ සඳහා දොරවෙල ගඟෙන් එන ජල කඳ සමඟ පෙට්ටිගල සිට පැමිණෙන ජලකඳ ද එක් වී ඇති බව සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා මේ වන විට ඉඩම් ගොඩකර තිබීමේ හේතුවත්, ගංගා අසළ ඇති විශාල ගස් කඩා වැටීම හා අනාරක්ෂිත ගස් නිසා ගඟ හරස් වීම ගංවතුර ඇතිවීමට බලපා ඇති බවත් පැවසීය. මේ නිසා වතුකාරගොඩ උඩකන්ද පාර අබලන් වූ අතර අවතැන් වූ අයට උදව් කළ හැකිනම් කුමන හෝ දෙයක් කළ යුතු බව ද කළ හැකි උපරිම දේ කිරීම සුදුසු බව ද පවසන ලදී.

***<u>ගංවතුරෙන් ආපදාවට ලක්වූවන් සඳහා සහන සැලසීම.</u>***

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව රු.10,000.00 ක උපරිමයකට යටත්ව ආපදාවන්ට ලක්වූවන් ආධාර ලබා දීම සඳහා සුදුසු බවට ගරු සභාපතිතුමා සිදු කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා</u>**

අද දින පැවති සභාව සාර්ථකව පැවැත්වීමට හැකි වූ අතර කුමන කාරණයක් දෙස හෝ බලන විට යට සිට නොව උඩ සිට බැලිය යුතු බව ද ඒ අනුව සියළු මන්ත්‍රීවරුන් සඳහා ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා පැහැදිලි කර දුන් පරිදි මෙය ස්වාභාව ධර්මය විසින් මිනිස් ක්‍රියාකාරකම් වෙනුවෙන්ලබාදුන් දඬුවමක් බව ද සඳහන් කළ ගරු සභාපතිතුමා, විශාල ධාරිතාවකින් පැමිණි ගංවතුර තත්ත්වය නිසා මිනිස් ජීවිතවලට හානි සිදු නොවන ලෙස දරුවෝ දෙදෙනෙක් හා මවකගේ ජීවිතය බේරා ගැනීම වෙනුවෙන් බළන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා ඇතුලු පිරිසට ස්තුතිය පුද කරන බවත් පැවසීය. එමෙන්ම ගංවතුර ඇතිවීම වැළැක්වීම සඳහා කටයුතු කිරීමේ දී අවශ්‍ය කරන තාක්ෂණය ප්‍රායෝගික වශයෙන් යොදා ගත යුතු බව ද සකස් කළ යුතු ස්ථාන පිළිබඳව සාකච්ඡා කළ අතර ඉදිරියේදී සකස් කළ යුතු ස්ථාන පිළිබඳව සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර, මේ සඳහා කටයුතු කරන බව ද සඳහන් කළේය. මීට අමතරව ඉඹුල්පේ ගරු සභාපතිතුමා විසින් ජල බවුසර ලබා දීම සම්බන්ධව එතුමාට ස්තුතිය පළ කරන අතර මෙහි දී සහයෝගය ලබා දුන් බළන්ගොඩ ප්‍රදේශිය සභාවේ ගරු සභාපතිතුමා, පොලිසිය, ග්‍රාම නිළධාරින්, මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලයට බළන්ගොඩ නගර සභාවේ සභාපති වශයෙන් ස්තුතිය පළ කරන බව ද ඉදිරියේදී ද අවශ්‍ය කටයුතු නිසියාකාරයෙන් ඉටුකිරීම සඳහා අවංක කැපවීම ලබා දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.